# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2412/35 - 2024 නොවැම්බර් මස 29 වැනි සිකුරාදා - 2024.11.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (XV) **(ඇ)**

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

22 වන වගන්තිය සමඟ කියවිය යුතු 27 (1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 22 වන වගන්තිය සමඟ කියවිය යුතු, 27(1) (ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍ය හරිනි අමරසූරිය වන මා විසින්, මේ නියමය මගින් ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වනු ලබන, (කලින් කලට සංශෝධිත පරිදි වූ ) ඉහත සඳහන් පනතේ 22 වන වගන්තිය යටතේ, 1996 ජූනි මස 20 වැනි දිනැති, අංක 928/16 දරන *අතිවිශේෂ* ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ උපලේඛනයේ 1 වන තීරය සහ 2 වන තීරය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය සංශෝධනය කරනු ලැබේ : -

"උපලේඛනය

| **1 වන තීරය** | **2 වන තීරය** |
|---|---|
| ජනමාධ්‍ය පීඨය | ජනමාධ්‍ය අධ්‍යයන අංශය,<br>භාෂා අධ්‍යයන අංශය,<br>පරිගණක අධ්‍යයන අංශය,<br>ප්‍රාසාංගික කලා අධ්‍යයන අංශය, " |

**හරිනි අමරසූරිය,**
අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍ය.

2024 නොවැම්බර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

EOG 11 - 0187


1A - PG 6927 - 204 (2024/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*